# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

## ඩෙන්ශ්‍රී අධ්‍යාපන පදනම (සංස්ථාගත කිරීමේ)

**ඩෙන්ශ්‍රී අධ්‍යාපන පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

මහනුවර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු දිළුම් අමුණුගම මහතා විසින්
2013 ජූනි මස 20 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2013 අප්‍රේල් මස 29 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

[252 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 6.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

2—PL 007359 -750 (2013/06)

# ඩෙන්ශ්‍රී අධ්‍යාපන පදනම
# (සංස්ථාගත කිරීමේ)

## ඩෙන්ශ්‍රී අධ්‍යාපන පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

*පූර්විකාව.*

''ඩෙන්ශ්‍රී අධ්‍යාපන පදනම '' යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන පදනමක් ඒ පදනමේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව එකී පදනමට සම්බන්ධ සියලු කරුණු හා පරමාර්ථ ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබූ හෙයින් ද :

එකී පදනම පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කරුණු සඳහා ද, ඒ පරමාර්ථ හා කරුණු එකී පදනම මෙතෙක් කල් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර සහ ඉටුකර ඇති හෙයින් ද, එම ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

*ලුහුඬු නාමය.*

**1.** මේ පනත 2013 අංක     දරන ඩෙන්ශ්‍රී අධ්‍යාපන පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

*ඩෙන්ශ්‍රී අධ්‍යාපන පදනම සංස්ථාගත කිරීම.*

**2.** මෙහි මින් මතු ''පදනම'' යනුවෙන් සඳහන් කරනු ලබන ඩෙන්ශ්‍රී අධ්‍යාපන පදනමේ දැනට සාමාජිකයන්ව සිටින තාක් තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු සාමාජිකයන් වශයෙන් ඇතුළත් කරනු ලබන තැනැත්තන් මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සහ ඉන්පසුව ''ඩෙන්ශ්‍රී අධ්‍යාපන පදනම'' යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති (මෙහි මින් මතු ''සංස්ථාව'' යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවක් බවට පත් වන්නේ ය. තව ද එකී නාමයෙන් ඒ සංස්ථාව විසින් ද, එයට විරුද්ධව ද සියලු අධිකරණවල දී නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද, එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය.

*සංස්ථාවේ පොදු පරමාර්ථ.*

**3.** සංස්ථාව සංස්ථාගත කරනු ලබන්නේ පහත සඳහන් පොදු පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සඳහා ය. :—

2- PL 007159 -75 (2013/04)

(අ) මේ වන විට පෙර පාසල් අධ්‍යාපනය සඳහා අවස්ථා අහිමිව දිවි ගෙවන ග්‍රාමීය හා යුද්ධයෙන් (අවතැන්ව) පීඩාවට පත් ළමුන් ද ඉලක්ක කර ගනිමින්, දිවයිනේ විවිධ ප්‍රදේශයන් හි පෙර පාසල් පිහිටුවීම වැනි ක්‍රියාකාරකම් ඇරඹීම තුළින් අධ්‍යාපනික සේවාවන් හි ගුණාත්මක බව වඩවමින් පවත්වාගෙන යාම ;

(ආ) අඩු ආදායම්ලාභී පවුල්වල සහ විශේෂිත හැකිය ඇති ළමුන් උදෙසා අධ්‍යාපන උපකරණ, පොත් පත්, නිල ඇඳුම් ආදිය ද ඇතුළු අධ්‍යාපන පහසුකම් සපයා දීම ;

(ඇ) ක්‍රීඩා සහ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයන් හි නිරත පාසල් සහ අධ්‍යාපන ආයතනවලට සහයෝගය සැපයීම / සහාය ලබා දීම ;

(ඈ) සමකාලීන තාරුණ්‍යයේ අභියෝගයන්ට ආමන්ත්‍රණය කළ හැකි වඩා උචිත මාධ්‍ය වනුයේ ඔවුන්ගේ දැනුමේ නිම්වළලු පුළුල් කිරීම බැවින්, ඒ සඳහා තුරුණු ගතිකත්වය අර්ථාන්විතව නායකත්ව පුහුණුවක් තුළින් ඔප්නැංවීම අරභයා ඔවුනට වැඩමුළු, දේශණ, සම්මන්ත්‍රණ, ප්‍රදර්ශණ අනුස්ථාපන වැඩසටහන්, ගුරු පුහුණු වැඩසටහන් ආදිය උදෙසා කටයුතු සංවිධානය ;

(ඉ) විවිධ වාර්ගික කණ්ඩායම් අතර හොඳහිත පැතිරෙන අයුරින් හා එකිනෙකාගේ හා ආගම් අතර මෙන් ම ජාතීන් අතර, සාමය හා සංහිඳියාව පැතිරවීම සඳහා සුදුසුතම පියවරක් වන සිංහල ජනයාට දෙමළ බසත්, දෙමළ ජනයාට සිංහල බසත්, සැම දෙනාටම ඉංග්‍රීසි බසත් වශයෙන් දැනුම්වත් කරමින් ඊට අවශ්‍ය පහසුකම් සපයා දී භාෂා බාධකය දුර කිරීම ;

(ඊ) වෘත්තීය පුහුණුව සහ කුසලතා සංවර්ධනය සඳහා අවස්ථා උදාකර දීම ;

(උ) පරිසරය සුරැකීම පිළිබඳ ළමුන් දැනුම්වත් කිරීමත්, ඔවුන් අතර පැල සිටුවීමේ පුරුද්දක් (සංස්කෘතියක්) ගොඩනැගීම තුළින් තිරසාර සංවර්ධනයක් උදා කිරීම ;

(ඌ) පුස්තකාල පහසුකම් ස්ථාපිත කර දී රූපවාහිනී සහ ගුවන් විදුලි අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම/ විකාශය ;

(එ) අඩු ආදායම්ලාභී පවුල්වල ළමුන් සඳහා උදව්දීමේ අටියෙන් අක්ෂි දාන, ලේ පරිත්‍යාග කිරීමේ සහ වෛද්‍ය සේවා කඳවුරු ජංගම සුවසේවා කඳවුරු ආදී සේවා ලබා දීම ;

(ඒ) ආයතනයේ අභිමතාර්ථ සාක්ෂාත් කරගනු වස් ඊට ආනුෂංගිකවූත්, උපකාරීවූත් අනෙකුත් සෑම ආකාරයක ම ක්‍රියාකාරකම් කටයුතු සහ අනෙකුත් සියලු දෑ ක්‍රියාත්මක කිරීම / ඉටු කිරීම.

**4.** (1) මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, සංස්ථාවේ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වාගෙන යාමේ හා වැසීමේ ද, ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේ ද, ප්‍රදාන හා පරිත්‍යාග භාරගැනීමේ හා එකතු කිරීමේ ද ස්වකීය අරමුදල් අයෝජනය කිරීමේ ද, සංස්ථාවේ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය නිලධරයන් හා සේවකයන් සේවයේ නියුක්ත කර ගැනීමේ, සේවයේ යෙදවීමේ සහ සේවයෙන් පහ කිරීමේ ද බලය ඇතුළුව සංස්ථාවේ පරමාර්ථ හෝ ඒ පරමාර්ථ අතුරින් යම් පරමාර්ථයක් ප්‍රවර්ධනය කිරීම හෝ නංවාලීම සඳහා අවශ්‍ය යෝග්‍ය කවර ආකාරයක හෝ සියලු ක්‍රියාවක් කිරීමේ, කාරණා ඉටු කිරීමේ හා ක්‍රියාවේ යෙදවීමේ බලය සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

**5.** (1) සංස්ථාවේ කටයුතු සභාපති, කළමනාකාර අධ්‍යක්ෂ, ලේකම්, භාණ්ඩාගාරික ඇතුළු සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට අනුකූලව තෝරා පත් කරගනු ලබන හය දෙදෙනකුට නොවැඩි සාමාජික සංඛ්‍යාවකගෙන් සමන්විත වූ විධායක කාරක සභාවක් විසින් මේ පනත අනෙකුත් විධිවිධානවලට සහ සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට අනුකූලව, කළමනාකරණය කරනු ලැබිය යුතු ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී පැවැති පදනමේ ධුර දරමින් සිටි සාමාජිකයන්ගෙන් සංස්ථාවේ පළමුවන කළමනාකරණ මණ්ඩලය සමන්විත විය යුතු ය.

**6.** (1) සංස්ථාව විසින් සංස්ථාවේ යම් මහා සභා රැස්වීමකට පැමිණ ඡන්දය දෙන සාමජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතරයකින් පහත දැක්වෙන කාරණා සියල්ලම හෝ ඉන් කිසිවක්

සංස්ථාවේ රීති.

හෝ සඳහා මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති කලින් කල සෑදීම නීත්‍යානුකූල වන්නේ ය:—

(අ) කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයන් තෝරා පත් කර ගැනීම, පත් කිරීම හෝ නම් කිරීම සහ ඔවුන්ගේ බලතල කාර්ය සහ ඔවුන්ගේ ධුර කලය ;

(ආ) සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, නියෝජිතයන්ගේ සහ සේවකයන්ගේ බලතල චර්යාව, කාර්ය සහ කර්තව්‍ය ;

(ඇ) සංස්ථාවේ හා කළමනාරණ කමිටුවේ රැස්වීම් කැඳවීමේ දී සහ පැවැත්වීමේ දී අනුගමනය කළයුතු කාර්ය පටිපාටිය, රැස්වීම් පවත්වන වේලාවන්, ස්ථාන සහ රැස්වීම් පිළිබඳ දැන්වීම්, න්‍යාය පත්‍ර සහ රැස්වීම්වල ගණපූරණය සහ ඒ රැස්වීම්වල කටයුතු පවත්වාගෙන යාම ;

(ඈ) සංස්ථාවේ කළමනාකරණ කමිටුවේ සාමාජිකත්වය සඳහා සුදුසුකම් හා නුසුදුසුකම් ;

(ඉ) සංස්ථාවේ දේපල පරිපාලනය හා කළමනාකරණය භාරකාරත්වය සහ එහි අරමුදල් ගිණුම් පවත්වාගෙන යාම ;

(ඊ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ සපුරාලීම.

(2) (1) වැනි උපවගන්තිය යටතේ සාදනු ලැබූ කවර වුව ද රීතියක් එවැනිම රැස්වීමක දී සහ එවැනි ම ආකාරයෙන් සංශෝධනය කිරීම, වෙනස් කිරීම ඊට යමක් එකතු කිරීම හෝ එය පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී බලාත්මක වූ පදනමේ රීති, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන තාක් දුරට මේ වගන්තිය යටතේ සෑදූ රීති ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) සංස්ථාවේ සියලු සාමාජිකයෝ සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත් විය යුත්තා හ.

පදනම විසින් ගෙවිය යුතු සහ ඊට අයවිය යුතු ණය.

**7.** මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවති පදනමේ සියලු ණය සහ බැරකම් සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, එදිනට පදනමට අයවිය යුතු සියලු ණය හා පදනම වෙත ගෙවිය යුතු දායක මුදල් හෝ සම්මාදම් මුදල් මෙම පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවිය යුතු ය.

සංස්ථාව විසින් චංචල හා නිශ්චල දේපල දැරිය හැකි බව.

**8.** යම් මිලට ගැනීමකින්, ප්‍රදානයකින්, පරිත්‍යාගයකින්, බූදල් පිළිබඳ නියාදනයකින් හෝ අන් ලෙසකින් සංස්ථාව සතු වන කවර වුව ද චංචල හෝ නිශ්චල දේපලක් මේ පනතේ විධිවිධානවලට යටත් ව භාර ගැනීමට හා දැරීමට සංස්ථාවට නීතියෙන් හැකියාව හා ශාක්‍යතාව තිබිය යුතු අතර, එබඳු සියළු දේපල තත් කාලයෙ හි සංස්ථාවේ බලාන්විතව පවතින රීති වලට යටත් ව විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ අන් ලෙසකින් බැහැර කිරීමේ පූර්ණ බලතල සහිතව, මේ පනතේ කාර්යයන් සඳහා සංස්ථාව විසින් ඒවා දරනු ලැබිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

**9.** සංස්ථාවේ මුද්‍රාව, සංස්ථාවේ විධිවිධානවලට අනුව තෝරා පත් කර ගත් තැනැත්තකු ඉදිරිපිට දී හැර කවර වූ යම් සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් සාධන පත්‍රයෙහි තම නම හා අත්සන තැබිය යුතු ය. තව ද එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් අත්සන් කරනු ලැබීමට පරිබාහිරව විය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**10.** මේ පනතේ සඳහන් තැනැත්තන්ගේ හා ඔවුන් මගින් ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම්පාන වෙනත් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට හැර ජනරජයේ හෝ වෙනත් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තන්ගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

**11.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.